# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

# 2014


177 , නාවල පාර

නාරාහේන්පිට

කොළඹ 05

දුරකථන - 0112-136600 / 0112-136650 / 0112-136700

ෆැක්ස් - 0112-369302 / 0112-369305

ඊ මේල් - sec-psc@sltnet.lk / info@psc.gov.lk

වෙබ් - www.psc.gov.lk

මගේ අංකය: PSC/ADM/06/02/05/2014
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
177, නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05

2015 සැප්තැම්බර් මස 08 දින.

මහ ලේකම්,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

මහත්මයාණෙනි,

**2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා**
**කාලපරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව මේ සමඟ ඔබ වෙත එවමි.

මෙයට - විශ්වාසී,

ටී.එම්.එල්.සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දැක්ම

ජාතියේ විශිෂ්ටත්වය සඳහා කැපවූ රාජ්‍ය සේවයක්.

## මෙහෙවර

සාධාරණව, විනිවිද බවින් හා සමානුකූලව මහජනයාට සේවය කිරීමට, කාර්යක්ෂම, විනයගරුක සහ තෘප්තියට පත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

## 2014.01.01 – 2014.05.12 කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

**සභාපති**

විද්‍යාජෝති වෛද්‍ය දයාසිරි ප්‍රනාන්දු මහතා

**සාමාජිකයන්**

ජනාධිපති නීතිඥ පාලිත එම්. කුමාරසිංහ මහතා

සිරිමාවෝ ඒ. විජේරත්න මහත්මිය

එස්.සී. මාන්නප්පෙරුම මහතා

ආනන්ද සෙනවිරත්න මහතා

එන්.එච්. පතිරණ මහතා

එස්. තිල්ලෙයිනඩරාජා මහතා

එම්.ඩී.ඩබ්ලිව්. ආරියවංශ මහතා

ඒ. මොහොමඩ් නහියා මහතා

## 2014.07.01 – 2014.12.31 කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

**සභාපති**

ජනාධිපති නීතිඥ විනිසුරු සත්‍යා හෙට්ටිගේ මහතා

**සාමාජිකයින්**

එස්.සී.මාන්නප්පෙරුම මහතා

ආනන්ද සෙනෙවිරත්න මහතා

එන්.එච්.පතිරණ මහතා

එස්. තිල්ලෙයිනඩරාජා මහතා

ඒ.මොහොමඩ් නහියා මහතා

කාන්ති විජේතුංග මහත්මිය

සුනිල් එස්. සිරිසේන මහතා

වෛද්‍ය අයි.එම්. ද සොයිසා ගුණසේකර මහතා

# පටුන


| අනු අංකය | | කාරණය | පිටුව |
|---|---|---|---|
| 1 | | හැඳින්වීම | 01 |
| 2 | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග | 01 |
| 3 | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල | 02 |
| | 3.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා | 03 |
| 4 | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | 03 |
| 5 | | සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබද විස්තර | 09 |
| | 5.1 | ආයතන අංශය | 10 |
| | 5.1.1 | ආයතන අංශයෙහි කාර්යභාරය | 10 |
| | 5.1.2 | ආයතන අංශයේ ප්‍රගති සමාලෝචනය (2014.01.01 – 2014.12.31) | 11 |
| | 5.1.3 | ආයතන අංශය මුහුණ දුන් අභියෝග ජය ගැනීමට හා කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියාමාර්ග | 15 |
| | 5.2 | පත්කිරීම් හා උසස් කිරීම් අංශය | 16 |
| | 5.2.1 | පත්කිරීම් හා උසස් කිරීම් අංශයෙහි කාර්යභාරය | 16 |
| | 5.2.2 | පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ ප්‍රගති සමාලෝචනය (2014.01.01 – 2014.12.31) | 18 |
| | 5.2.3 | 2014 වසරේ පත්කිරීම් හා උසස් කිරීම් අංශයේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | 19 |
| | 5.2.4 | පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියා මාර්ග | 26 |
| | 5.3 | විනය අංශය | 27 |
| | 5.3.1 | විනය අංශයෙහි කාර්යභාරය | 27 |
| | 5.3.2 | විනය අංශයේ ප්‍රගති සමාලෝචනය (2014.01.01 – 2014.12.31) | 29 |
| | 5.3.3 | විනය අංශයේ කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියා මාර්ග | 30 |
| | 5.4 | අභියාචනා අංශය | 30 |
| | 5.4.1 | අභියාචනා අංශයේ ප්‍රගති සමාලෝචනය (2014.01.01 – 2014.12.31) | 31 |
| | 5.4.2 | 2014 වර්ෂයේ අභියාචනා අංශයේ කාර්ය සාධනයට අදාල වූ අභියෝග හා වෙනත් කරුණු | 33 |
| | 5.5 | පාලන අංශය | 34 |
| | 5.6 | මූල්‍ය අංශය | 34 |
| 6 | | මුදල් ප්‍රතිපාදනය | 35 |
| 7 | | කාර්ය මණ්ඩලය | 35 |
| | 7.1 | සංවිධාන සටහන | 35 |
| | 7.2 | කාර්ය මණ්ඩල සංයුතිය | 35 |
| | 7.3 | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු | 36 |
| 8 | | 2014 වර්ෂය තුළ එක් එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන | 36 |
| 9 | | කොමිෂන් සභා රැස්වීම් | 37 |
| 10 | | ස්තුතිය | 37 |
| 11 | | ඇමුණුම් | 39-43 |

## 01. හැඳින්වීම

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. 2011.05.13 දින සිට පත් කරනු ලැබූ කොමිෂන් සභාවේ කාලය 2014.05.12 දිනෙන් අවසන් වූ අතර 2014.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත කොමිෂන් සභාවක් පත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) අනු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2014 ජනවාරි 01 වන දින සිට 2014 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1946 මැයි මස 15 දිනැති ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව මඟින් ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. එමඟින්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් පිළිබඳ විධායක බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙන ලදී.

වර්ෂ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ, එතෙක් වසර විසි හයක් පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර රාජ්‍ය සේවය පිළිබඳ අධිකාරී බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිණ.

වර්ෂ 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එම කොමිෂන් සභාව අභියාචනා බලධාරියා වශයෙන් පමණක් කටයුතු කරන ලදී. 1992 වර්ෂයේදී රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන්ගේ (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සිට ඉහළ තනතුරු හැර) පත් කිරීම් , උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ විධායක බලතල අමාත්‍ය මණ්ඩලය විසින් පවරන ලද අභිනියෝජිත බලය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී. කොමිෂන් සභාව හෝ එමඟින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ඉඩ සැලසෙන බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.

වර්ෂ 2001 දී, 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්, රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති IX වන පරිච්ඡේදය පරිච්ඡින්න කොට නව පරිච්ඡේදයක් ඇතුළත් කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත

ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වූ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුණි. මෙම සංශෝධනය මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තත්වය ප්‍රබල වෙනසකට භාජනය වූ අතර, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරු කිරීම හා විනය පාලනය කිරීම පිලිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබුණු බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. තවද මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත්කෙරිණි.

වර්ෂ 2010 දී , 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරනු ලැබ ඇත. මෙය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු කොමිෂන් සභාවකි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ඔවුහු තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා ස්වකීය ධුර හොබවන අතර, තවදුරටත් එවැනි එක් කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් වනු ඇත.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 55(1) අනු ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, පොලිස් නිලධාරීන් ද ඇතුළු ව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත.

## 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල

18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයන් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලින් පත්කරන ලද පළාත් රාජ්‍ය සේවකයින්, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අමාත්‍යංශ ලේකම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත නිලධාරීන් සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයන්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවා වලට ගැනෙන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ,

- පත්කිරීම
- උසස් කිරීම
- ස්ථාන මාරු කිරීම
- විනය පාලනය හා සේවයෙන් පහ කිරීම , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

## 3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථාවන්හි දී හැරුණ විට කොමිෂන් සභාවේ තීරණ කිසිදු අධිකරණයකදී හෝ විනිශ්චය සභාවකදී මත විමසුමකට ලක්කළ නොහැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 අ ව්‍යවස්ථාව අනුව 126 ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන හා (5) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය පනතින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනය කිරීම.

## 04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

2014 ජනවාරි මස 01 දින සිට 2014 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමස්ත ශ්‍රී ලාංකික ජාතියේ උන්නතියත්, මාතෘ භූමියේ සංවර්ධනයත් උදෙසා ගෞරවනීය රාජ්‍ය සේවයක් ඇතිකරලීමේ හා පවත්වා ගෙන යාමේ තිර අදිටනින් විනිවිදභාවය හා අවංකභාවය පෙරදැරි කර ගෙන තම කටයුතු කරගෙන යන ලදි.

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමේදී හා උසස් කිරීමේදී එක් එක් සේවාවන් සඳහා සුවිශේෂි වූ දැනුම, කුසලතාවය, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන්, අදාළ බඳවා ගැනීම් හා උසස්කිරීමේ පටිපාටිවලට අනුගතව විනිවිද භාවයෙන් යුක්තව බඳවා ගැනීමට හා උසස් කිරීමට කටයුතු කර ඇත. නිසිකලට විධිමත්ව පත්කිරීම් සිදුකිරීම මගින් රාජ්‍ය සේවයේ වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන දැනුම හා කුසලතාවය හෙබි තරුණ පිරිසක් විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමට හැකියාව ලැබී ඇති අතර උසස් කිරීමේ පටිපාටිවලට අනුව අප්‍රමාදව උසස්කිරීම් සිදුකිරීම මගින් රාජ්‍ය නිලධාරීන් තුළ අභිප්‍රේරණය ඇති කිරීමෙන් ගුණාත්මක හා සඵලදායී රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමට ක්‍රියා කර ඇත.

එතෙකුදු වුවත් ආයතන ප්‍රධානින් විසින් තම ආයතනයන්ට අදාළ බඳවා ගැනීමේ දැන්වීම් විභාග දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරන වාර්ෂික විභාග දින දර්ශනයට අනුව විභාග පැවැත්වීමට හැකිවන පරිදි නිසි කාල සීමාවන් තුළ ප්‍රසිද්ධියට පත් කිරීමට අපොහොසත්වීම, සමහර බඳවා ගැනීම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගැනීමට බාධාවක් වී ඇත.

අමාත්‍ය මණ්ඩලය මගින් ප්‍රතිපත්තිමය තීරණ ලබාගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කළ යුතුව ඇති බඳවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධ කාර්යයන් කෙරෙහි අදාළ ආයතන විසින් නිසි අවධානය යොමු නොකිරීමද කොමිෂන් සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති අතර, නියමිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි අනුමතව තිබියදීත් සුවිශේෂී දැනුමක් හා කුසලතාවක් අවශ්‍ය නොවන තනතුරු සඳහා විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යොදවා ගැනීමට බොහෝ ආයතන විසින් වැඩි නැඹුරුතාවයක් දැක්වීම රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන බවද එය ගුණාත්මක හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමට හානි කර තත්ත්වයක් මතු කරන බවද නිරීක්ෂණය කර ඇත.

අමාත්‍යංශ ලේකම්වරුන්/ආයතන ප්‍රධානීන් විසින් මූලික විමර්ශන පවත්වා වසර ගණනාවක් ගත වූ පසු ඒ මත පදනම්ව නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කරන ලෙස නිර්දේශ කරමින් අදාළ චෝදනා පත්‍ර කෙටුම්පත් ඉදිරිපත් කිරීම එක් ගැටලුවකි. මෙහි දී බොහෝ අවස්ථාවල චෝදනා පත්‍ර කෙටුම්පත්වල ඇතුළත්ව ඇත්තේ ඉක්මනින් කටයුතු කර අවසන් කළ හැකි වූ එතරම් බරපතල නොවන වරදවල් වන අතර, මෙම තත්ත්වය වඩාත් බැරෑරුම් වනුයේ යම් නිලධාරියෙක් විශ්‍රාම ගැන්වීමට ආසන්න වූ පසු, වසර ගණනාවකට පෙර ඔහු විසින් සිදු කරන ලදැයි සලකනු ලැබූ වැරදි පිළිබඳව චෝදනා පත්‍ර කෙටුම්පත් ඉදිරිපත් කිරීමයි. මෙවැනි අවස්ථාවල දී අදාළ විනය ගැටලුව නිරාකරණය වන තුරු නිලධාරියාගේ විශ්‍රාම ගැන්වීම පිළිබඳ තීරණයක් ලබා දීමට අවකාශ නොමැති අතර ඔහුගේ විශ්‍රාම වැටුප ලබාදීමට පමා වීම ද මේ හේතුවෙන් සිදුවේ.

එසේම මූලික විමර්ශනය පවත්වා වසර ගණනාවකට පසු චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමේ දී විනය ක්‍රියාවලියේ ගුණාත්මක බවට ද හානි පැමිණේ. එවැනි අවස්ථාවල අදාල සාක්ෂිකරුවන් විශ්‍රාම යාම, මිය යාම, කල් පසුවීම නිසා ලිපිලේඛන සොයා ගැනීමට නොහැකිවීම වැනි කරුණු හේතුවෙන් විනය ක්‍රියාවලිය නිසියාකාරව පවත්වා ගෙන යාමට අපහසු වී ඇත. මෙපරිදි විනය ක්‍රියා මාර්ග පවත්වා ගැනීම නිසා විනය ක්‍රියාවලියක ඵලදායීතාවය පිළිබඳ ගැටලු ඇති වේ. අනවශ්‍ය ප්‍රමාදවීම් නිසා නිලධාරීන්ට ලැබිය යුතු වරප්‍රසාද අහිමිවීමද සිදුවන බව නිරීක්ෂණය වේ.

අමාත්‍යංශ ලේකම්වරුන්/ආයතන ප්‍රධානීන් විසින් විනය ක්‍රියා මාර්ග කඩිනමින් ඉටු කරවා ගැනීමට අවශ්‍ය පියවර නොගැනීම ද කොමිෂන් සභාව මුහුණ පා ඇති ගැටලුවකි. නිදසුන් ලෙස යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යංශ ලේකම්ගේ/ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ හා නිර්දේශ කැඳවා ඇති අවස්ථාවක දී හෝ අඩුපාඩු වී ඇති යම් යම් ලිපිලේඛන කැඳවා ඇති අවස්ථාවක දී සිහිකැඳවීම් ගණනාවක් යැවුව ද ඒ සඳහා පිළිතුරු පමා වීම නිසා විනය ක්‍රියාවලිය අපේක්ෂිත මට්ටමින් අවම කාලසීමාවක් ඇතුළත පවත්වා අවසන් කිරීමට බාධා පැමිණ ඇත. ඉහත තත්ත්වයන් නිසා සමස්ත විනය ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවයට හා ගුණාත්මක බවට හානි පැමිණ තිබීමත් දැකිය හැකිවේ.

මෙම තත්ත්වයට විසඳුමක් ලෙස 2014 වසර තුළ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය සමඟ එක්ව කටයුතු කරමින්, අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවල විනය කටයුතු පිළිබඳ විෂය භාර නිලධාරීන් කැඳවා පුහුණු සැසි පැවැත්වීම සඳහා කටයුතු කරන ලදී.

විධිමත් විනය පරීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීමේදී අදාල අමාත්‍යංශ ලේකම්වරයා සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සම්බන්ධයෙන්ද විමර්ශන කටයුතු සිදුකල යුතු බව පෙනී යන අවස්ථා තිබේ. ඔවුන් පිළිබඳ විනය බලධාරීත්වය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී නොතිබීම නිසා එවැනි අවස්ථා වලදී අදාල විනය ක්‍රියාමාර්ග ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වේ. මේ හේතුවෙන් බරපතල විනය කරුණු හා සම්බන්ධ ක්‍රියා මාර්ග මග හැරී යන අවස්ථා උද්ගත වේ. මෙම තත්වය වලක්වා වඩාත් සාර්ථක විනය ක්‍රියාවලියක් පවත්වාගෙන යාම පිණිස අමාත්‍යංශ ලේකම්වරුන්ගේ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ විනය ක්‍රියාවලිය සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වගකීමක් පැවරීම සුදුසු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථා මගින් අදාළ තනතුරුවල දැනට සිටින නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධ විධිවිධාන (ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව) පැහැදිලිව සඳහන් කර තිබියදීත් ඇතැම් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් අදාළ අන්තර්ග්‍රහණයන් කළයුතු ආකාරය පිළිබඳව නිරන්තරයෙන් උපදෙස් විමසා ලිපි එවීම හේතුවෙන් එවැනි අන්තර්ග්‍රහණයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පැන නැගී ඇති ගැටලු සම්බන්ධයෙන් අදාළ ආයතනවල විෂය භාර මාණ්ඩලික නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත කැඳවා සාකච්ඡා කිරීමට හා වාර්ෂිකව පවත්වනු ලබන සමාලෝචන රැස්වීමේදී අන්තර්ග්‍රහණ ක්‍රියාදාමය සම්බන්ධයෙන් පොදුවේ අතිරේක ලේකම්වරුන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් අදාල චක්‍රලේඛවල පැහැදිලිව සඳහන් කර තිබෙන විධිවිධාන පිළිබඳව නිසි

අධ්‍යයනයකින් තොරව, ඇතැම් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් එම කරුණු වලට අදාළ ගැටලු පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පවා රහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ඉල්ලා ලිපි එවීමද ඒ හේතුවෙන් රාජ්‍ය නිලධාරීන් විසින් කරන ලද විවිධ ඉල්ලීම් සඳහා පිළිතුරු ලබා දීමද සුලභ සිද්ධියක් වූයේය. මෙයට පිළියමක් ලෙස අදාළ ආයතනවල විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් කැඳවා ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කෙරිණි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන බඳවා ගැනීමේ පරිපාටි සහ සේවා ව්‍යවස්ථා වල දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කිරීමට නොහැකි වන යම් විශේෂ අවස්ථාවලදී එකී විධිවිධානවලින් බැහැරව කටයුතු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව කටයුතු කර ඉන් පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ඒ සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීම තුළින් පැන නැගුණු අනවශ්‍ය ගැටලුද නිරීක්ෂණය වූ අවස්ථා තිබිණි.

රාජ්‍ය සේවයේ නිලධාරීන්ට තම සේවයට අදාළ වන පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ විනය පාලනය යන කරුණු පිළිබඳව ඇතිවන ගැටලු හේතුවෙන් අගතියට පත් නිලධරයන්හට සාධාරණ අභියාචනා අවස්ථා සුරක්ෂිත කිරීමටත්, පවත්නා නීතිමය ප්‍රතිපාදන තුළ, එම ගැටලු සඳහා සාධාරණ හා අපක්ෂපාතී තීරණ ලබා දීමටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කර ඇත. එනමුත් යම් කාල වකවානුවක් නියම කරමින් වාර්තා ඉදිරිපත් කිරීමට දැනුම් දීම් කළ ද, එම කාල වකවානු වලදී අදාළ වාර්තා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොවීම, අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් රජයේ නිලධරයන්ගේ අභියාචනා සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කිරීමේ දී එම තොරතුරු වල නිරවද්‍යතාව පිළිබඳ දැඩි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් නැවත නැවත තොරතුරු කැඳවීමට සිදු වීම, ආයතන සංග්‍රහය, වෙනත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි මෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල පැහැදිලිව සඳහන් කරුණු සම්බන්ධයෙන් පවා නිවැරදි නොවන තීරණ ගෙන තිබීම හා එවැනි අවස්ථා වලදී වාර්තා අපැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම, එක් එක් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වල කාර්ය සහ කර්තව්‍ය එකිනෙකට වෙනස් වන්නා සේම එක් එක් ආයතනයන්හි රජයේ නිලධරයින් විසින් සිදු කරන වැරදි වල ප්‍රබලතාව නිලධරයින්ගේ තරාතිරම අනුවද වෙනස් විය හැකි වුවද, එවැනි තත්ත්වයන් පැහැදිලිව වාර්තා නොකිරීම වැනි තත්වයන් යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන තීරණ ප්‍රමාද වී ඇත.

මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිරන්තරයෙන් කරුණු ඉදිරිපත් කරන අතර සියලු කාරණා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානය යොමුකර පවත්නා නීතිමය රාමුව යටතේ ලබා දිය හැකි උපරිම සහන ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කර ඇත. මහජන පෙත්සම් කාරක සභාව විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු

ලබන සියලුම මහජන පෙත්සම් මනා අයුරින් අධ්‍යයනය කර ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තා මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමටත්, විවිධ අවස්ථාවල කරනු ලබන දැනුම් දීම් පරිදි අදාළ නිලධාරීන් මහජන පෙත්සම් කාරක සභාව ඉදිරියේ කරුණු දැක්වීම සඳහා යොමු කිරීමටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කර ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය තුළ ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව තත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කර පවත්වා ගෙන යනු ලබන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පිරිනමනු ලබන ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය 2014.02.22 දින සිට වසර තුනක කාලයක් සඳහා ලබා ගන්නා ලදි. මෙම තත්ව කළමනාකරණ පද්ධතිය තුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් නිරන්තරයෙන් සිදු කරනු ලබන අතර, ඒ තුළින් අදාළ ක්‍රියාවලි සඳහා කාල නිර්ණායක හා වැඩ අදියර හඳුන්වා දී ඇති බැවින් සාධාරණ කාලරාමු තුළ වඩාත් ක්‍රමවත්ව කාර්යයන් ඉටු කිරීමේ හැකියාව ලැබී ඇති නිසා සියලුම කාර්යයන් නිරවද්‍යව හා කඩිනම්ව නිම කිරීමට හැකියාව ලැබී ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අදාළව කාර්යාලය වෙත දෛනිකව ලැබෙන ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් හරහා පරිගණක ගත කරනු ලබයි. මෙහිදී ලිපිය පිළිබඳ වැදගත් තොරතුරු සියල්ල පරිගණක ගත කරනු ලබන අතර සෑම ලිපියකටම අනන්‍ය වූ අංකයක් ලබා දේ. ජාලගත කරන ලද පරිගණක පද්ධතිය තුළින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සියලුම පරිගණක එකිනෙක සම්බන්ධ කර ඇති බැවින් කාර්යාලය වෙත ලැබෙන ලිපි මෙම පද්ධතිය හරහා අදාළ අංශ වෙත යොමු කිරීමෙන් අනතුරුව එක් එක් ලිපිය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සියල්ල පියවරෙන් පියවරට සුපරීක්ෂණය කරමින් යාවත්කාලීන කළ හැකි වන අතර, එමගින් යම් ලිපියක් සම්බන්ධයෙන් විමසීම් කරන අයෙකුට ලේඛන කළමනාකරණ පද්ධතිය භාවිතා කරමින් එම ලිපිය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගයේ වර්තමාන තත්වය පිළිබඳව කඩිනමින් පැහැදිලි විස්තරයක් ලබා දීමටද හැකි වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇති මෙම ලිපි ලේඛන කළමනාකරණ පද්ධතිය වෙනත් රාජ්‍ය ආයතන වල ලිපි ලේඛන සම්බන්ධ කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා ලබා දීමටද කටයුතු කර ඇත.

මහා භාණ්ඩාගාර පරිශ්‍රයේ ස්ථානගත කර තිබූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය 1997 වර්ෂයේ ඔක්තෝබර් මස සිට මේ දක්වා වරින් වර විවිධ ස්ථාන හතක පවත්වාගෙන ගොස් තිබේ. මේ තත්ත්වය මත ලී බඩු හා කාර්යාලයීය උපකරණ ප්‍රවාහනය කිරීමට විශාල ලෙස වියදම් දරා ඇති අතර කාර්යාල ගොඩනැගිලි සඳහා මාසික කුලිය වශයෙන්ද විශාල මුදලක් වියදම් කර ඇත. එබැවින් 2013 වසරේදී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශයට යාබදව පිහිටා තිබෙන පිඹුරු අංක මු.කො.පි. 9175 හි කැබලි අංක 27 මගින් දැක්වෙන හෙක්ටයාර් 0.1770 (පර්චස් 70 ) ක් වූ ප්‍රමාණයේ රජයට අයත් බිම් කොටසක්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි කිරීම පිණිස වෙන්කර දී ඇත.

ඒ අනුව, නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා වන ඇස්තමේන්තුගත වියදම වන රුපියල් මිලියන 670 ක මුදල සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර අදාළ ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකිරීමටත් අනුමත කර ඇත. දීර්ඝ කාලයක් තිස්සේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සඳහා අඩුපාඩුවක්ව පැවති ස්ථිර කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට හැකිවීම ඉතා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළ අවස්ථාවකි.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය මගින් රාජ්‍ය නිලධාරීන් වෙත ඉටු කරනු ලබන සේවය පිළිබඳ ඔවුන්ට තොරතුරු ලබා දීම සඳහා පුළුල් වැඩ පිළිවෙලක් දැන් ක්‍රියාත්මක වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ/නිවේදන/නීති රෙගුලාසි/කාර්ය පරිපාටි පිළිබඳව තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියට ඇතුළත් කිරීම තුළින් වඩාත් යුහුසුළුව හා පහසුවෙන් එම තොරතුරු ලබා ගැනීමේ හැකියාව ලැබී ඇත.

එමෙන්ම සෑම සතියකම බදාදා දිනය, මහජන දිනය ලෙස ක්‍රියාත්මක වේ. එම දිනය තුළ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය කරා පැමිණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති තම කරුණු සම්බන්ධයෙන් විමසා බැලීමට හා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට රාජ්‍ය නිලධාරීන්ට අවස්ථාව සලසා දී ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභා නිලධාරීන්ගේ සුභසාධනය සඳහාත්, ක්‍රීඩා හා විනෝදාස්වාදය සඳහාත් කාර්යාලයීය සුභ සාධක සංගමය මගින් විවිධ වැඩසටහන් ඉතා ඉහළ මට්ටමින් සංවිධානය කෙරිණි. සුභ සාධක සංගමය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික විනෝද චාරිකාව , අවුරුදු උත්සවය, පොසොන් දන්සැල හා කලා හැකියාවන් විදහා දක්වන ගී ගොනුව ප්‍රසංගය වැනි ක්‍රියාකාරකම් මෙම වසර තුළදීත් සාර්ථකව සිදු කෙරිණි.

2012 වර්ෂයේදී පකිස්ථානයේ ඉස්ලාමාබාද් නුවර පැවැති රාජ්‍ය/සිවිල් සේවා ප්‍රධානීන්ගේ දෙවන සමුළුවේදී කරන ලද ඉල්ලීම පරිදි, එහි තෙවන සමුළුව ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට යෝජනා කර තිබිණි.

ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා ප්‍රධානීන්ගේ තෙවන සමුළුව 2014.01.09 හා 2014.01.10 යන දෙදින තුළ කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවැත්වුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයීය නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් මෙම සමුළුව සංවිධානය කරන ලද අතර සාක් රටවල් නියෝජනය කරමින් එම රටවල රාජ්‍ය/සිවිල් සේවා කොමිෂන් සභා ප්‍රධානීන් රැසක් මේ සඳහා සහභාගි විය. මෙම සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් නියෝජ්‍ය මුදල් අමාත්‍ය ගරු සරත් අමුණුගම මහතා සහභාගි වූ අතර අමාත්‍යාංශ ලේකම් වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විශාල පිරිසක් මීට සහභාගි විය.

මෙම සමුළුවේදී සාක් රටවල රාජ්‍ය සේවා කොමිෂන් සභා වල කාර්ය කටයුතු සමාලෝචනය කරනු ලැබූ අතර ඒ ඒ රටවල් අතර හැකියා වර්ධන සහ සහයෝගිතා වැඩමුළු සඳහා සම්මුතීන් ඇතිකරගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවද සාක් රටවල රාජ්‍ය සේවා කොමිෂන් සභා නිලධාරීන් වෙනුවෙන් රාජ්‍ය සේවයේ කාර්යසාධන කළමනාකරණය සම්බන්ධ වැඩමුළුවක් පැවැත්වීමට එකඟ වූ අතර මීළඟ රාජ්‍ය සේවා කොමිෂන් සභා ප්‍රධානීන්ගේ සමුළුව බංග්ලාදේශයේ ඩකා හිදී පැවැත්වීමටත් තීරණය කරන ලදී.

සාක් රටවල රාජ්‍ය සේවයේ කාර්යසාධන කළමනාකරණය සම්බන්ධ වැඩමුළුව 2014.09.17 හා 2014.09.18 යන දෙදින තුළ සාක් රටවල රාජ්‍ය/සිවිල් සේවා කොමිෂන් සභා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් කොළඹ කිංග්ස්බරි හෝටලයේදී පවත්වන ලදී. ඒ ඒ රටවල පවතින කාර්යසාධන කළමනාකරණ පද්ධතීන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙන්ම දැනුම හුවමාරු කර ගැනීම සඳහා ද මෙම වැඩමුළුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලදී.

මෙම ක්‍රියාවලියට අමතරව ජාතික මට්ටමේ ඉලෙක්ට්‍රොනික මානව සම්පත් කළමනාකරණ (e-HRM) පද්ධතියක් සැකසීමේ කටයුතු තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය සමඟ සහයෝගීත්වයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී. මේ සම්බන්ධව මූලික අධ්‍යයන වාර්තාව සකසා ගැනීමට මෙම වසර තුල හැකියාව ලැබිණි. පෙර කී ආයතන සමඟ එක්ව මෙම ව්‍යාපෘතිය සාර්ථකව ඉදිරියට කරගෙන යාම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

## 05. සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ විස්තර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අංශයන් ස්ථාපිත කොට අවශ්‍ය දායකත්වය ලබා ගෙන ඇත.

- ආයතන අංශය
- පත්කිරීම් හා උසස්කිරීම් අංශය
- විනය අංශය
- අභියාචනා අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය

## 5.1 ආයතන අංශය

ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ආ ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසනු ලබන තෙක්, ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනයේ දී රාජ්‍ය සේවයට අදාළව බලාත්මකව පැවති සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, එම පරිච්ඡේදය යටතේ රාජ්‍ය සේවයට සම්බන්ධව සාදනු ලැබූ හෝ විධිවිධාන සලස්වනු ලැබූ රීති, නියෝග හා කාර්ය පටිපාටි අවශ්‍ය වෙනස් කිරීම් සහිතව බලාත්මකව පවතින ලෙස සැලකිය යුතු බව සඳහන් වී ඇත. ඒ අනුව රාජ්‍ය සේවයට අදාළ රීති, නියෝග හා කාර්ය පටිපාටි පිළිබඳ විධිවිධාන සැලැස්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙහි ආයතන අංශය විසින් ඉටු කරනු ලැබේ.

ආයතන අංශය සඳහා අනුමත තනතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| අතිරේක ලේකම් | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 04 |
| කළමනාකරණ සහකාර | 07 |

### 5.1.1 ආයතන අංශයෙහි කාර්යභාරය

- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් වගකීම් සහ බලතල පැවරීමට අදාළ කටයුතු.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සම්පාදනය, සංශෝධනය හා ප්‍රසිද්ධ කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීම සහ ඒ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- චක්‍රලේඛ, නියෝග හා උපදෙස් නිකුත් කිරීම.


- රාජ්‍ය සේවයට අදාළ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සහ සංශෝධනය කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි, චක්‍රලේඛ සහ නියෝගවලින් බැහැර වන අවස්ථාවලදී ඒ පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය පටිපාටික රීති වලින් ආවරණය නොවන කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
- රාජ්‍ය සේවයට අදාළ කාර්ය පටිපාටික රීති වලට අනුව දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම, යථාවත් කිරීම, පවත්වා ගෙන යාම සහ තොරතුරු බෙදා හැරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම හා සංශෝධනය කිරීම.

### 5.12 ආයතන අංශයේ ප්‍රගති සමාලෝචනය (2014.01.01 – 2014.12.31)

ඉහත කාල සීමාව තුළ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.

| | කාරණය | එකතුව |
|---|---|---|
| 1 | නව බඳවා ගැනීම් පරිපාටි | 117 |
| 2 | නව සේවා ව්‍යවස්ථා | 04 |
| 3 | බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය | 44 |
| 4 | සේවා ව්‍යවස්ථා සංශෝධනය | 17 |
| 5 | ස්ථාන මාරු පරිපාටි | 06 |
| 6 | චක්‍රලේඛ | 03 |
| 7 | විශේෂ අවස්ථාවන්හිදී බඳවා ගැනීම් පරිපාටි වලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 37 |
| 8 | විශේෂ අවස්ථාවන්හිදී සේවා ව්‍යවස්ථා වලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම්. | 11 |
| 9 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට අදාළ කරුණු | 01 |
| 10 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 114 |
| 11 | පොදු කරුණු | 51 |
| 12 | ශ්‍රේෂ්ඨාධිකරණය, පරි.අභි.විනි.අධිකාරය, අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 57 |
| 13 | බඳවා ගැනීමේ පරිපාටි සහ සේවා ව්‍යවස්ථාවල නිවැරදි කිරීම් | 24 |
| | **එකතුව** | **486** |

වගුව අංක 01




රූප සටහන අංක 01

**2014 වර්ෂයේ සකස් කරන ලද බඳවා ගැනීමේ පරිපාටි - (117)**

| අනු අංකය | අමාත්‍යාංශය | අනුමත කරන ලද ප්‍රමාණය |
|---|---|---|
| 1 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන | 5 |
| 2 | මුදල් හා ක්‍රම සම්පාදන | 4 |
| 3 | මහාමාර්ග, වරාය හා නාවික | 1 |
| 4 | බුද්ධශාසන හා ආගමික කටයුතු | 3 |
| 5 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 6 |
| 6 | සෞඛ්‍ය | 4 |
| 7 | ඛණිජ තෙල් කර්මාන්ත | 0 |
| 8 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන | 0 |
| 9 | ජල සම්පාදන හා ජලාපවහන | 0 |
| 10 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන | 0 |
| 11 | පළාත් පාලන හා පළාත් සභා | 0 |
| 12 | කර්මාන්ත හා වාණිජ කටයුතු | 1 |
| 13 | විදුලි බල හා බලශක්ති | 1 |
| 14 | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් | 4 |
| 15 | අධිකරණ | 8 |
| 16 | ආර්ථික සංවර්ධන | 2 |
| 17 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා | 1 |
| 18 | උසස් අධ්‍යාපන | 1 |

| | | |
|---|---|---|
| 19 | විදේශ කටයුතු | 1 |
| 20 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු | 2 |
| 21 | පාර්ලිමේන්තු කටයුතු | 0 |
| 22 | තැපැල් සේවා | 2 |
| 23 | ජාතික උරුමයන් පිළිබඳ | 1 |
| 24 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති | 0 |
| 25 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු | 2 |
| 26 | කම්කරු හා කම්කරු සබඳතා | 2 |
| 27 | අධ්‍යාපන | 3 |
| 28 | වැවිලි කර්මාන්ත | 0 |
| 29 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 1 |
| 30 | ඉඩම් හා ඉඩම් සංවර්ධන | 6 |
| 31 | සමාජ සේවා | 1 |
| 32 | ක්‍රීඩා | 4 |
| 33 | කෘෂිකර්ම | 2 |
| 34 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | 3 |
| 35 | ප්‍රවාහන | 4 |
| 36 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන | 3 |
| 37 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ | 3 |
| 38 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 4 |
| 39 | දේශීය වෛද්‍ය | 2 |
| 40 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන | 1 |
| 41 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන | 0 |
| 42 | සිවිල් ගුවන් සේවා | 0 |
| 43 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන | 0 |
| 44 | සංස්කෘතික හා කලා කටයුතු | 0 |
| 45 | ආපදා කළමනාකරණ | 2 |
| 46 | වනජීවී සම්පත් සංරක්ෂණ | 3 |
| 47 | නැවත පදිංචි කිරීමේ | 1 |
| 48 | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු | 3 |
| 49 | පුද්ගලික ප්‍රවාහන සේවා | 0 |
| 50 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන | 0 |
| 51 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ | 0 |
| 52 | තාක්ෂණ හා පර්යේෂණ | 2 |
| 53 | ඵලදායිතා ප්‍රවර්ධන | 1 |
| 54 | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ | 0 |

| | | |
|---|---|---|
| 55 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 2 |
| 56 | ජනාධිපති කාර්යාලය | 6 |
| 57 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 0 |
| 58 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු | 2 |
| 59 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 1 |
| 60 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 1 |
| 61 | නීතිය හා සාමය පිළිබඳ | 4 |
| 62 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 1 |
| | එකතුව | 117 |

**2014 වර්ෂයේ සකස් කරන ලද ස්ථානමාරු පරිපාටි - (06)**

1. සමාජ සුභසාධන අධිකාරී සහ ස්ථානභාර නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පරිපාටිය
2. වාර්ෂික ස්ථානමාරු පරිපාටිය - 2015 (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය)
3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ස්ථානමාරු පරිපාටිය - 2015
4. ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක සහ ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහායක නිලධාරීන් ස්ථානමාරු පරිපාටිය
5. ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු පරිපාටිය
6. ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු පරිපාටිය

**2014 වර්ෂය තුළ නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ (03)**

01/2014 - කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම.

02/2014 - රාජ්‍ය සේවයේ “සක්‍රිය සේවා කාලය” පිළිබඳ අර්ථ නිරූපණය

03/2014 - 2006.01.01 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ හා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නව සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන් බලාත්මක වීම.

**2014 වර්ෂයේ සංශෝධනය කරන ලද සේවා ව්‍යවස්ථා (17)**

1. ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථාව (දෙවරක් සංශෝධනය කර ඇත)
2. ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව
3. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාව
4. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව
5. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාව
6. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථාව

7. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව
8. ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව
9. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව (දෙවරක් සංශෝධනය කර ඇත)
10. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාව
11. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාව
12. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව
13. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව
   (12, 13 — මඩිහහේවා කමිටුවේ නිර්දේශ අනුව පැරණි සේවා ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම සංශෝධනය කර ඇත.)
14. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා ව්‍යවස්ථාව
15. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව

**2014.01.01 සිට 2014.12.31 දක්වා අනුමත කරන ලද සේවා ව්‍යවස්ථා (04)**

1. ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවා ව්‍යවස්ථාව
2. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව
3. ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව (මඩිහහේවා කමිටුවේ නිර්දේශ අනුව සකස් කරන ලදී)
4. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාව

**5.1.3 ආයතන අංශය මුහුණ දුන් අභියෝග ජය ගැනීමට හා කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියාමාර්ග**

1) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථාවල අදාළ තනතුරුවල දැනට සිටින නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධ විධිවිධාන (ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව) පැහැදිලිව සඳහන් කර තිබියදීත් ඇතැම් දෙපාර්තමේන්තු හා අමාත්‍යංශ විසින් අදාළ අන්තර්ග්‍රහණයන් කළයුතු ආකාරය පිළිබඳව නිරන්තරයෙන් උපදෙස් විමසා ලිපි එවීම.

   - එවැනි අන්තර්ග්‍රහණයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පැන නැගී ඇති ගැටලු සම්බන්ධයෙන් අදාළ ආයතනවල විෂය භාර මාණ්ඩලික නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත කැඳවා සාකච්ඡා කිරීමට හා වාර්ෂිකව පවත්වනු ලබන සමාලෝචන රැස්වීමේදී අන්තර්ග්‍රහණයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පොදුවේ අතිරේක ලේකම්වරුන් දැනුවත් කිරීමට පියවර ගැනීම.

2) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් චක්‍රලේඛවල පැහැදිලිව සඳහන් කර තිබෙන විධිවිධාන පිළිබඳව නිසි අධ්‍යනයකින් තොරව, ඇතැම් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් එම කරුණු වලට අදාළ ගැටලු පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ රහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ඉල්ලා ලිපි එවීම හා ඒ හේතුවෙන් රාජ්‍ය නිලධාරීන් විසින් කරන ලද ඉල්ලීම් සඳහා පිළිතුරු ලබා දීමට ප්‍රමාද වීම.

- අදාළ ආයතනවල විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් කැඳවා ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

3) යම් විශේෂ අවස්ථාවන් වලදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන බඳවා ගැනීමේ පරිපාටි සහ සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධාන අනුව කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවලදී එකී විධිවිධානවලින් බැහැරව කටයුතු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව නිවැරදි නොවන ආකාරයෙන් කටයුතු කර ඉන් පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීම තුළින් අනවශ්‍ය ගැටලු පැන නැගීම.

## 5.2 පත්කිරීම් හා උසස් කිරීම් අංශය

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි අංක 1733/52 හා 2011.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ සේවයේ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් හා උසස් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත්කිරීම් හා උසස් කිරීම් අංශය මගින් ඉටුකරනු ලැබේ. මෙම අංශය සඳහා අනුයුක්ත නිලධාරී මණ්ඩලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 09 |
| පරිපාලන නිලධාරී | 01 |
| කළමනාකරණ සහකාර | 24 |

### 5.2.1 පත්කිරීම් හා උසස් කිරීම් අංශයෙහි කාර්යභාරය

පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ කාර්යභාරය පහත සඳහන් පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු කෙරේ.

## I. පත්කිරීම්

අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම්/ උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම, සේවයේ ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩබැලීමේ/ රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත්කිරීම, මුදාහැරීම (ස්ථිර/ තාවකාලික), කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට/ තනතුරට නැවත පත්කිරීම, විශ්‍රාම ගැන්වීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත/ අනිවාර්ය/ වෛද්‍ය හේතූන් පදනම මත), විශ්‍රාම ගිය රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම, සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම.

## II. උසස් කිරීම්


අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පරිපාටි අනුව උසස් කිරීම ( ශ්‍රේණියෙන් ශ්‍රේණියට / ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත) , තනතුරු වලට පත් කිරීම. (ජ්‍යෙෂ්ඨතාවය මත / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල වලට අනුව)

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනුකරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන්ද කටයුතු කරනු ලැබේ.

### 5.2.2. පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ ප්‍රගති සමාලෝචනය (2014.01.01 – 2014.12.31)

| | කාරණය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | විශ්‍රාම ගැන්වීම් | 683 |
| 2 | ස්ථිර කිරීම් | 1889 |
| 3 | බඳවා ගැනීම් | 4252 |
| 4 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | 1821 |
| 5 | තෝරාගැනීම් මත උසස් කිරීම් | 504 |
| 6 | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම | 573 |
| 7 | කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම් | 37 |
| 8 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 312 |
| 9 | වැඩ බැලීමට /රාජකාරි ඉටුකිරීමට පත් කිරීම් | 1037 |
| 10 | මුදා හැරීම් | 120 |
| 11 | ඉල්ලා අස්වීම් | 48 |
| 12 | තනතුරු වලට පත් කිරීම් | 694 |
| 13 | අන්තර්ග්‍රහනය කිරීම් | 4919 |
| 14 | අභියාචනා | 55 |
| | එකතුව | 16944 |

වගුව අංක 02




රූප සටහන අංක 02

සමාලෝචිත කාළය තුළ කටයුතු කළ අධිකරණ නඩු ගණන

| | මුළු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 72 |
| අභියාචනාධිකරණ නඩු | 09 |
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පැමිණිලි | 185 |

වගුව අංක 03

### 5.2.3. 2014 වසරේ පත්කිරීම් හා උසස් කිරීම් අංශයේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

රාජ්‍ය සේවයේ ඉහල මට්ටමේ තනතුරු වලට/ශ්‍රේණිවලට පත් කිරීමේ දී/උසස් කිරීමේ දී අදාළ නිලධාරීන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් මෙන්ම විවිධ තනතුරුවල සේවය කිරීමේ පලපුරුද්ද කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. එමගින් සුදුසුතම නිලධාරීන් අදාළ තනතුරුවලට තෝරා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇති අතර, එම තෝරා ගැනීම් සාධාරණ හා විනිවිදභාවයකින් යුක්තව කර ගැනීමට හැකිවන පරිදි සම්මුඛ පරීක්ෂණවලදී තෝරා ගැනීමේ නිර්නායක ඇතුළත් ලකුණු පටිපාටි කොමිෂන් සභාව විසින් අනුමත කර සම්මුඛ පරීක්ෂණයට පෙර නිලධාරීන් / අයදුම්කරුවන් වෙත ලැබීමට සලස්වන ලෙස අමාත්‍යංශ ලේකම්වරුන් / ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇත.

ඇතැම් අමාත්‍යංශ හා වෙනත් රාජ්‍ය ආයතනවලින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී සිදුවන ප්‍රමාද අවම කර ගැනීම සඳහා සිහිකැඳවීම් යැවීමට අමතරව එම ආයතනවල අදාළ නිලධාරීන් දුරකථනය මඟින් සම්බන්ධ කරගෙන අවශ්‍ය තොරතුරු නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීමෙන් නිලධාරීන්ට / අයදුම්කරුවන්ට සිදුවිය හැකි අසාධාරණය පිළිබඳව දැනුවත් කිරීමටද කටයුතු කර ඇත. ඒ හේතුවෙන් එවැනි ආයතනවලින් අප්‍රමාදව තොරතුරු ලබාගෙන බොහෝ පත්වීම් හා උසස්වීම් කඩිනමින් ලබාදී ඇත.

ගැටලුකාරී තත්ත්වයන් මතුවූ අවස්ථාවල අදාළ අමාත්‍යංශ ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති ඇතුළු කොමිෂන් සභා සමාජිකයන් ද , රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ද සමඟ දීර්ඝ වශයෙන් සාකච්ජා කර කිසිදු පාර්ශවයකට අගතියක් නොවන පරිදි පවත්නා නීතිමය රාමුව තුළ එකඟතාවයනට පැමිණෙමින් එම ගැටලු නිරාකරණය කර දීමට කටයුතු කර ඇත.

**විශ්‍රාම ගැන්වීම්**

| | | |
|---|---|---|
| 1. | අධ්‍යාපන අමාත්‍යංශය | 133 |
| 2. | අධිකරණ අමාත්‍යංශය | 1 |

| | | |
|---|---|---|
| 3. | ආපදා කළමනාකරණ අමාත්‍යංශය | 2 |
| 4. | ආර්ථික සංවර්ධන අමාත්‍යංශය | 1 |
| 5. | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශය | 12 |
| 6. | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය | 11 |
| 7. | කෘෂිකර්ම අමාත්‍යංශය | 33 |
| 8. | ජනාධිපති කාර්යාලය | 1 |
| 9. | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශය | 2 |
| 10. | තැපැල් සේවා අමාත්‍යංශය | 19 |
| 11. | දේශීය වෛද්‍ය අමාත්‍යංශය | 21 |
| 12. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය | 25 |
| 13. | ප්‍රවාහන අමාත්‍යංශය | 3 |
| 14. | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය | 1 |
| 15. | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශය | 8 |
| 16. | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය | 5 |
| 17. | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය | 119 |
| 18. | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය | 20 |
| 19. | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය | 1 |
| 20. | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය | 120 |
| 21. | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය | 10 |
| 22. | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 3 |
| 23. | විදේශ කටයුතු අමාත්‍යංශය | 3 |
| 24. | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාශය | 1 |
| 25. | සෞඛ්‍ය අමාත්‍යංශය | 128 |
| | | **683** |

**ස්ථිර කිරීම්**

| | | |
|---|---|---|
| 1 | ආපදා කළමනාකරණ අමාත්‍යංශය | 1 |
| 2 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය | 5 |
| 3 | කෘෂිකර්ම අමාත්‍යංශය | 5 |
| 4 | ජනාධිපති කාර්යාලය | 8 |
| 5 | දේශීය වෛද්‍ය අමාත්‍යංශය | 11 |
| 6 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය | 29 |
| 7 | ප්‍රවාහන අමාත්‍යංශය | 6 |
| 8 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය | 1 |
| 9 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශය | 17 |
| 10 | මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 1 |
| 11 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය | 11 |
| 12 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය | 19 |
| 13 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය | 3 |
| 14 | විදේශ කටයුතු අමාත්‍යංශය | 3 |
| 15 | ශ්‍රී ලංකා තක්සේරු සේවය | 8 |
| 16 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 85 |
| 17 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 135 |

| | | |
|---|---|---|
| 18 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 90 |
| 19 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 37 |
| 20 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 19 |
| 21 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 7 |
| 22 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | 16 |
| 23 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 12 |
| 24 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 100 |
| 25 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 1 |
| 26 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 13 |
| 27 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 1223 |
| 28 | සහකාර පොලිස් අධිකාරි | 21 |
| 29 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යංශය | 1 |
| 30 | සෞඛ්‍ය අමාත්‍යංශය | 1 |
| | | **1889** |

**බඳවා ගැනීම්**

| | | |
|---|---|---|
| 1 | අධිකරණ අමාත්‍යංශයේ භාෂා පරිවර්තක අධිකාරී | 1 |
| 2 | ඒකාබද්ධ තැපැල් සේවය විධායක සේවා ගණය | 17 |
| 3 | කම්කරු අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 4 | ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 5 | ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 1 |
| 6 | තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී | 1 |
| 7 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 8 | පර්යේෂණ නිලධාරී | 1 |
| 9 | ප්‍රවාහන අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 10 | පශු වෛද්‍ය නිලධාරී | 40 |
| 11 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 12 | මිනුම් ඒකක හා ප්‍රමිත සේවා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ | 1 |
| 13 | රාජ්‍ය නීතිඥ | 1 |
| 14 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 15 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 16 | රේගු අධිකාරී | 21 |
| 17 | වාණිජ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ | 4 |
| 18 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශයේ නීති නිලධාරී | 1 |
| 19 | වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ | 7 |
| 20 | වෙළඳ නාවික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නීති නිලධාරී | 1 |
| 21 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 470 |
| 22 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 184 |
| 23 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 137 |
| 24 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 9 |
| 25 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 1 |
| 26 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 42 |
| 27 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | 211 |
| 28 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 430 |
| 29 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 37 |
| 30 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 1 |
| 31 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 77 |

| | | |
|---|---|---|
| 32 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 2522 |
| 33 | සත්ව පාලන නිලධාරී | 9 |
| 34 | සත්ව සංවර්ධන නිලධාරී | 1 |
| 35 | සහකාර කම්කරු කොමසාරිස් | 15 |
| 36 | සෞඛ්‍ය අමාත්‍යංශයේ නීති නිලධාරී | 2 |
| | | **4252** |

**ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම්**

| | | |
|---|---|---|
| 1 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය | 14 |
| 2 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය | 1 |
| 3 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය | 23 |
| 4 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය | 44 |
| 5 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය | 2 |
| 6 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 3 |
| 7 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 404 |
| 8 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 183 |
| 9 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 13 |
| 10 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 10 |
| 11 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 6 |
| 12 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 27 |
| 13 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 35 |
| 14 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 103 |
| 15 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 2 |
| 16 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 5 |
| 17 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 830 |
| 18 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 116 |
| | | **1821** |

**තෝරා ගැනීම් මත උසස් කිරීම්**

| | | |
|---|---|---|
| 1 | ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව | 4 |
| 2 | ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ | 1 |
| 3 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශය | 15 |
| 4 | තක්සේරු දෙපාර්තමේන්තුව | 2 |
| 5 | තැපැල් සේවා අමාත්‍යංශය | 5 |
| 6 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශය | 3 |
| 7 | නියෝජ්‍ය පොලිස්පති | 1 |
| 8 | නියෝජ්‍ය රේගු අධිකාරී | 92 |
| 9 | නියෝජ්‍ය විගණකාධිපති | 8 |
| 10 | ප්‍රවාහන අමාත්‍යංශය | 36 |
| 11 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශය | 5 |
| 12 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය | 20 |
| 13 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 1 |
| 14 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාශය | 81 |
| 15 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 2 |
| 16 | රේගු අධ්‍යක්ෂ | 8 |
| 17 | වනජීවී සම්පත් අමාත්‍යංශය | 1 |

| | | |
|---|---|---|
| 18 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 19 |
| 19 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 41 |
| 20 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 75 |
| 21 | සුරාබදු කොමසාරිස් | 2 |
| 22 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 82 |
| | | **504** |

**කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම්**

| | | |
|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 2 |
| 2 | අධ්‍යාපන අමාත්‍යාංශය | 11 |
| 3 | අධිකරණ අමාත්‍යාංශය | 4 |
| 4 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 13 |
| 5 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 57 |
| 6 | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය | 2 |
| 7 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 17 |
| 8 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 5 |
| 9 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 20 |
| 10 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 2 |
| 11 | තාක්ෂණ, පර්යේෂණ හා පරමානුක බලශක්ති අමාත්‍යාංශය | 1 |
| 12 | තැපැල් සේවා අමාත්‍යාංශය | 35 |
| 13 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 14 |
| 14 | නීතිය හා සාමය අමාත්‍යාංශය | 22 |
| 15 | ප්‍රවාහන අමාත්‍යාංශය | 203 |
| 16 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 3 |
| 17 | පුනරුත්තාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 1 |
| 18 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 1 |
| 19 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 107 |
| 20 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 2 |
| 21 | වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය | 1 |
| 22 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 2 |
| 23 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 48 |
| | | **573** |

**කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම්**

| | | |
|---|---|---|
| 1 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 5 |
| 2 | වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය | 1 |
| 3 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 31 |
| | | **37** |

**කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ**

| | | |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 7 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 22 |

| | | |
|---|---|---|
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යංශය | 1 |
| 4 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශය | 5 |
| 5 | කෘෂිකර්ම අමාත්‍යංශය | 2 |
| 6 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යංශය | 1 |
| 7 | තැපැල් සේවා අමාත්‍යංශය | 1 |
| 8 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශය | 1 |
| 9 | ප්‍රවාහන අමාත්‍යංශය | 6 |
| 10 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය | 9 |
| 11 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය | 59 |
| 12 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය | 12 |
| 13 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය | 2 |
| 14 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය | 5 |
| 15 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය | 97 |
| 16 | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යංශය | 2 |
| 17 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය | 1 |
| 18 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 2 |
| 19 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 16 |
| 20 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 2 |
| 21 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 3 |
| 22 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 1 |
| 23 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 16 |
| 24 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 1 |
| 25 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 2 |
| 26 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යංශය | 12 |
| 27 | සමාජ සේවා අමාත්‍යංශය | 3 |
| 28 | සෞඛ්‍ය අමාත්‍යංශය | 21 |
| | | **312** |

**වැඩ බැලීමට / රාජකාරි ඉටු කිරීමට පත් කිරීම්**

| | | |
|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ | 1 |
| 2 | අතිරේක ලේකම් | 10 |
| 3 | අතිරේක සොලිසිටර් ජනරාල් | 4 |
| 4 | ආපදා කළමනාකරණ අමාත්‍යංශය | 2 |
| 5 | ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යංශය | 1 |
| 6 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය | 8 |
| 7 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය | 5 |
| 8 | කෘෂිකර්ම අමාත්‍යංශය | 15 |
| 9 | තැපැල් සේවා අමාත්‍යංශය | 20 |
| 10 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශය | 5 |
| 11 | පරිසර හා පුනර්ජනනීය අමාත්‍යංශය | 4 |
| 12 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය | 2 |
| 13 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය | 197 |
| 14 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 2 |
| 15 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 3 |
| 16 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1 |

| | | |
|---|---|---|
| 17 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 1 |
| 18 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 28 |
| 19 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 8 |
| 20 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 16 |
| 21 | ශ්‍රී ලංකා කෘෂි කර්ම සේවය | 105 |
| 22 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 154 |
| 23 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 3 |
| 24 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය | 4 |
| 25 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 52 |
| 26 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 276 |
| 27 | ශ්‍රී ලංකා රේගුව | 38 |
| 28 | ශ්‍රී ලංකා වස්තු විද්‍යාඥ සේවය | 2 |
| 29 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 18 |
| 30 | ශ්‍රී ලංකා විදේශ සේවය | 1 |
| 31 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 26 |
| 32 | සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව | 20 |
| 33 | සොලිසිටර් ජනරාල් | 4 |
| 34 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 1 |
| | | **1037** |

**මුදා හැරීම්**

| | | |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 26 |
| 2 | ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය | 2 |
| 3 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 9 |
| 4 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 1 |
| 5 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 55 |
| 6 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 6 |
| 7 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 1 |
| 8 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 20 |
| | | **120** |

**ඉල්ලා අස්වීම්**

| | | |
|---|---|---|
| 1 | අධිකරණ අමාත්‍යාංශය | 1 |
| 2 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 3 |
| 3 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 3 |
| 4 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 2 |
| 5 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 1 |
| 6 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 3 |
| 7 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 1 |
| 8 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 33 |
| 9 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 1 |
| | | **48** |

**තනතුරු වලට පත් කිරීම්**

| | | |
|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ | 1 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 1 |
| 3 | අතිරේක රේගු අධ්‍යක්ෂ | 1 |
| 4 | අතිරේක ලේකම් | 18 |
| 5 | අතිරේක සොලිසිටර් ජනරාල් | 7 |
| 6 | අධ්‍යාපන අමාත්‍යංශය | 42 |
| 7 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශය | 19 |
| 8 | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 4 |
| 9 | ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ | 14 |
| 10 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 9 |
| 11 | නියෝජ්‍ය රේගු අධිකාරී | 253 |
| 12 | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 7 |
| 13 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශය | 4 |
| 14 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය | 1 |
| 15 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 51 |
| 16 | සොලිසිටර් ජනරාල් | 1 |
| 17 | සෞඛ්‍ය අමාත්‍යංශය | 261 |
| | | **694** |

**අන්තර්ග්‍රහනය කිරීම්**

| | | |
|---|---|---|
| 1 | තැපැල් සේවා අමාත්‍යංශයේ විධායක සේවා ගණය | 48 |
| 2 | රාජ්‍ය කළමනාකරණ සහකාර අධි පන්තිය | 429 |
| 3 | රෙජිස්ට්‍රාර් ජනරාල් සේවය | 56 |
| 4 | වාණිජ දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය | 40 |
| 5 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 303 |
| 6 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 594 |
| 7 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 260 |
| 8 | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 418 |
| 9 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 2134 |
| 10 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 303 |
| 11 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 334 |
| | | **4919** |

### 5.2.4. පත් කිරීම් හා උසස් කිරීම් අංශයේ කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියා මාර්ග

පත්කිරීම් හා උසස් කිරීම් අංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් ලැබෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී හඳුන්වා දී ඇති නිශ්චිත කාල රාමුව තුළ තම කාර්යයන් ඉටු කිරීම අපේක්ෂා කරමින් නිරතුරුවම අභ්‍යන්තර සෝදිසි කිරීම් හා තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා පසු විපරම් කටයුතු කිරීමට ක්‍රියා කර

ඇත. එසේම නව පරිගණක , මුද්‍රණ යන්ත්‍ර හා ලිපිගොනු කැබිනෙට්ටු ආදී පහසුකම් ලබා දීමෙන් හා නවක නිලධාරීන් පුහුණු කරවීම හරහා ඔවුන්ගේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහල නංවීමට පියවර ගෙන ඇත. එමඟින් අංශය තුළ කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි විය.

## 5.3 විනය අංශය

මධ්‍යම රජයට අයත් මාණ්ඩලික නිලධරයන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ පළමු වන උප ලේඛනයෙහි සඳහන් වැරදිවලට අදාළ විනය පාලන බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව, රජයේ නිලධාරීන් සම්බන්ධව, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ දෙවන උප ලේඛනයෙහි සඳහන් වැරදිවලට අදාළ විනය පාලනය සම්බන්ධ අභියාචන බලධරයා ලෙස ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ඉහත කී බලතල ප්‍රකාරව ඒ ඒ අවස්ථාවන්හිදී අවශ්‍ය නියෝග ලබා දීම සඳහා විනය අංශය කොමිෂන් සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි. මෙම අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 06 |
| කළමනාකරණ සහකාර | 15 |

### 5.3.1 විනය අංශයෙහි කාර්යභාරය

දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් හෝ අමාත්‍යංශ ලේකම්වරුන් මඟින් සිදු කරනු ලබන මූලික විමර්ශනවලට අදාළව දීප ව්‍යාප්ත සේවාවන්වලට අයත් නිලධාරීන්ගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1733/52 හා 2011.11.25 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන්ගේ විනය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. මූලික විමර්ශන වාර්තාවක් විනය අංශයට ලැබීමෙන් අනතුරුව එය පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කොට අදාළ නිරීක්ෂණ සම්පූර්ණ කරගැනීමෙන් පසුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සුදුසු තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කළහොත් එම චෝදනා පත්‍රය අදාළ නිලධාරියාට අමාත්‍යංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් භාර දීමට කටයුතු කරනු ලබන අතර එම චෝදනා පත්‍රයට චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුර සහ ඒ සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ තීරණයක් ගනු ඇත.

විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළහොත් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයෙන් සුදුසු නිලධාරියෙකු පරීක්ෂණ නිලධාරී ලෙස පත්කර එම විධිමත් විනය පරීක්ෂණය සිදු කරන ලෙස නියම කරනු ලැබේ. යම් හෙයකින් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වීමට තීරණය කළහොත් චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුර හා ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අදාළ අමාත්‍යංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කර ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ සුදුසු දඬුවමක් පැනවීම හෝ සිදු කරනු ලබයි.

විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වුණි නම් එම පරීක්ෂණයේ වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබුණ පසු එම විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සියලුම වාචික හා ලිඛිත සාක්ෂි ද චූදිත නිලධාරීගේ පරිපාලන බලධාරියාගේ නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ චෝදනා එකකට, කිහිපයකට හෝ සියල්ලටම වරදකරු කොට සුදුසු විනය නියෝගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

තවද විනය ක්‍රියාපටිපාටියේ කොටසක් වශයෙන් කිසියම් චූදිත නිලධාරියෙක් වැඩ තහනමට ලක් කිරීම හෝ එවැනි වැඩ තහනමේ පසුවන නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම හෝ අනිවාර්ය නිවාඩු මත තැබීම හෝ නොනිමි විනය කරුණු පවතිද්දී අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන්නේ නම් එකී විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් කිරීම හෝ සිදු කරනු ලැබේ.

ඉහත සඳහන් කටයුතුවලට අමතරව සේවය හැරයාමේ නිවේදනවලට එරෙහිව දීප ව්‍යාප්ත සේවාවන්වලට අයත් නිලධාරීන් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1733/52 හා 2011.11.25 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු සහ එම අභියාචනා සම්බන්ධයෙන් එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් සුදුසු පරිදි නැවත සේවයේ පිහිටුවීම/ නොපිහිටුවීම සිදු කරනු ලැබේ.


තවද, කොමිෂන් සභාව විසින් පනවනු ලබන විනය නියෝගවලට හෝ එවැනි විනය කටයුතු පිළිබඳ තීරණයන්ට එරෙහිව උපරිමාධිකරණ සහ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරනු ලැබේ. විනය අංශය වෙත ලැබෙන සියලුම ලිපිලේඛන

පිළිබඳව සවිස්තරාත්මකව කරුණු අධ්‍යයනය කර අපක්ෂපාතී තීරණ ගැනීම සඳහා නිරවුල්ව, එම කරුණු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම විනය අංශයේ කාර්ය භාරය වේ.

### 5.3.2 විනය අංශයේ ප්‍රගති සමාලෝචනය - (2014.01.01 – 2014.12.31)

| | කාරණය | නියෝග ගණන |
|---|---|---|
| 1 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 31 |
| 2 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 11 |
| 3 | චෝදනා වලින් නිදහස් කිරීම | 33 |
| 4 | සේවයෙන් පහ කිරීම | 03 |
| 5 | අනෙකුත් විනය දඬුවම් | 41 |
| 6 | නැවත සේවයේ පිහිටුවීම | 23 |
| 7 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම | 23 |
| 8 | වි.වැ.ව්‍ය. සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 13 |
| 9 | අනිවාර්ය නිවාඩු ගැන්වීම | 06 |
| 10 | වැඩ තහනම් කිරීම | 03 |
| 11 | විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම | 92 |
| 12 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම් සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 22 |
| 13 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම | 05 |
| 14 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 197 |
| | **එකතුව** | **503** |

වගුව අංක 04




රූප සටහන අංක 03

2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා කටයුතු කරමින් පැවති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු හා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර අභියාචනා ප්‍රමාණය පහතින් දක්වා ඇත.

| | | |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | - | 32 |
| අභියාචනාධිකරණ අයදුම්පත් | - | 21 |
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර අභියාචනා | - | 126 |

### 5.3.3. විනය අංශයේ කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියා මාර්ග

I. දැනට ක්‍රියාත්මක වන තොරතුරු කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම සෑම සතියකම එක් දිනක දී පරීක්ෂා කිරීමට එක් කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියකු වෙත පැවරීම.

II. ලැබෙන ලිපි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා පෙර වසරේදී සකසන ලද කාල රාමුව අනුව කටයුතු කිරීම

III. අංශයේ මාසික රැස්වීම් පැවැත්වීම මගින් ගැටළු සාකච්ඡා කිරීම

IV. විෂය කරුණු සම්බන්ධයෙන් ගෙන ඇති, ඉදිරියේ දී පූර්වාදර්ශ ලෙස ගතහැකි තීරණ අභ්‍යන්තර හා බාහිර වශයෙන් වෙනම ගොනු කර ලේඛන ගත කිරීම.

V. මූලික විමර්ශන පැවැත්වීම හා විනය පරීක්ෂණ කාර්ය භාරය පිළිබඳව දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් නිලධාරීන් සහභාගී කරගෙන වැඩ මුළුවක් පැවත්වීමට අදහස් කිරීම.

### 5.4 අභියාචනා අංශය

බලය අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරීන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන්, තීරණ ගැනීම සඳහාත්, එම අභියාචනා සම්බන්ධයෙන් නියමිත කාල රාමුව තුළදී තීරණ ලබා දීම සඳහාත් අභියාචනා අංශය කොමිෂන් සභාවට සහාය ලබා දෙයි.

අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව නියම කළ පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 1733/52 දරන 2011.11.25 දිනැති රජයේ (අති විශේෂ) ගැසට් නිවේදනයේ දක්වා ඇති රජයේ නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන ව්‍යවස්ථාව ප්‍රකාරව අභිනියෝජනය කරනු ලැබ ඇත. ඉහත සඳහන් බලය අභිනියෝජිත බලධාරියෙකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියෙකුට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ලබා දී ඇත.

එසේම එවැනි අභියාචනයක් ලැබුණු විට ඒ පිළිබඳව සොයා බලා එම නියමය අවලංගු කිරීම හෝ වෙනස් කිරීම මඟින් රජයේ නිලධරයන්ට සහනයක් සලසා දීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (2) අනු ව්‍යවස්ථාව මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හිමි වී ඇත.

මෙම ප්‍රතිපාදනයන්ට අනුකූලව රජයේ නිලධරයන්ගෙන් අභියාචනා විශාල සංඛ්‍යාවක් කොමිෂන් සභාව වෙත නිරන්තරයෙන් ඉදිරිපත් වේ. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධව අදාළ විධිවිධාන පරිදි කටයුතු කිරීම අභියාචනා අංශය මගින් සිදුකෙරේ.

මීට අමතරව උක්ත කර්තව්‍යයන්ට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත කරනු ලබන අභියාචනා සහ උපරිමාධිකරණයන්හි ගොනු කරනු ලබන නඩු (අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන පෙත්සම් සහ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කරනු ලබන මූලික අයිතිවාසිකම් අයදුම්පත්) සම්බන්ධව කටයුතු කිරීම ද, නියම කරනු ලබන අවස්ථාවන්හි දී පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයෙහි පෙනී සිටිමින් කරුණු දැක්වීම හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගොස් කරුණු පැහැදිලි කිරීම ද මෙම අංශය මගින් සිදු කෙරේ. තව ද, මහජන පෙත්සම් කාරක සභාව විසින් අභියාචනා අංශයට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන මහජන පෙත්සම් මැනවින් අධ්‍යයනය කර කොමිෂන් සභා නියෝග මත ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තා මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ද, විවිධ අවස්ථාවල කරනු ලබන දැනුම් දීම් පරිදි අදාළ නිලධාරීන් මහජන පෙත්සම් කාරක සභාව ඉදිරියේ කරුණු දැක්වීම සඳහා යොමු කිරීමට ද, මෙම අංශය මගින් කටයුතු කරනු ලැබේ.


කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 06 |
| කළමනාකරණ සහකාර | 13 |

**5.4.1 අභියාචනා අංශයේ ප්‍රගති සමාලෝචනය ( 2014.01.01 – 2014.12.31 )**

| | කාරණය | ගණන |
|---|---|---|
| 1 | 2014 වර්ෂය තුළ ලැබුණු අභියාචනා | 2143 |
| 2 | වාර්තා ලැබී නොමැති අභියාචනා | 1125 |
| 3 | වාර්තා ලැබී කටයුතු කරමින් පවතින අභියාචනා | 431 |
| 4 | කටයුතු නිමකළ අභියාචනා ගණන | 1427 |
| 5 | අධිකරණ නඩු ගණන | 49 |
| 6 | කටයුතු කරමින් පැවැති පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර නඩු ගණන | 266 |
| 7 | අදාළ කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන | 44 |

වගුව අංක 05





රූප සටහන අංක 04

| | | | |
|---|---|---|---|
| | 2014 වර්ෂය තුළ ලැබුණු අභියාචනා | | අධිකරණ නඩු ගණන |
| | වාර්තා ලැබී නොමැති අභියාචනා | | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරී නඩු ගණන |
| | වාර්තා ලැබී කටයුතු කරමින් පවතින අභියාචනා | | මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන |
| | කටයුතු නිමකළ අභියාචනා ගණන | | |

**2014 වසරේ කටයුතු නිමකළ අභියාචනා - වර්ගීකරණය**

| | අභියාචනා - වර්ගය | කටයුතු නිමකළ ගණන |
|---|---|---|
| 1 | විනය හේතු | 304 |
| 2 | උසස්කිරීම් | 87 |
| 3 | සේවය හැරයාම් | 454 |
| 4 | ස්ථාන මාරු කිරීම් | 379 |
| 5 | පත්කිරීම් | 10 |
| 6 | වැඩ තහනම් කිරීම් | 33 |
| 7 | වෙනත් | 160 |
| | එකතුව | 1427 |

වගුව අංක 06




රූප සටහන අංක 05

| | | | |
|---|---|---|---|
| | විනය හේතු | | පත්කිරීම් |
| | උසස්කිරීම් | | වැඩ තහනම්කිරීම් |
| | සේවය හැරයාම් | | වෙනත් |
| | ස්ථාන මාරු කිරීම් | | |

### 5.4.2 2014 වසරේ අභියාචනා අංශයේ කාර්යසාධනයට අදාළ වූ අභියෝග සහ වෙනත් කරුණු

2014 වසර මැදදී මාණ්ඩලික හා කළමනාකරණ සහකාර නිලධාරීන් කීපදෙනෙකු ශාඛාවෙන් ස්ථාන මාරුවීම, හේතුවෙන් පළපුරුදු කාර්ය මණ්ඩලය පිළිබඳ ගැටලු සහගත තත්ත්වයකට මුහුණ දීමට සිදුවිය. 2014 වසරේ පැමිණි නවක නිලධාරීන් පුහුණු කරමින් දෛනික රාජකාරි කටයුතු කිරීම අභියෝගයක් විය. එසේ වුවද, ඉතිරිව සිටි පළපුරුදු නිලධාරීන්ගේ දැඩි කැපවීම හා කාර්යක්ෂමතාව හේතුවෙන් සතුටුදායක කාර්යසාධනයක් අත්කර ගැනීමට හැකිවිය.

අභියාචනා අංශයේ නිලධාරීන්ගේ දැඩි කැපවීම හා කාර්යක්ෂමතාව හේතුවෙන්, 2015 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළව ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් නියමිත කාල රාමුව තුළදී තීරණ ලබා දීමට හැකිවිය.

ශාඛාවේ කටයුතු වඩාත් ක්‍රමවත් කරගැනීම සඳහාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම කාලක්‍රමානුගතව සිදු කිරීම සඳහාත් උපක්‍රමයක් වශයෙන්, වාර්තා ලැබුණු ලිපිගොනු එක් ස්ථානයකට එකතුකොට කාලක්‍රමානුගතව කටයුතු කිරීමට, 2013 වර්ෂයේ සැප්තැම්බර් මස සිට ආරම්භ කරන ලද ක්‍රමවේදය 2014 වර්ෂයේ දී වඩාත් විධිමත් කිරීමට හැකිවිය.

## 5.5 පාලන අංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු පාලන අංශය වෙත පැවරී ඇත. අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) මෙම අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

පාලන අංශය පහත සඳහන් කාර්යභාරය මෙහෙයවනු ලබයි

- කොමිෂන් සභා කාර්යාලයේ සමස්ත පරිපාලනය
- කොමිෂන් සභා කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණය
- තොරතුරු කළමනාකරණ කටයුතු

මෙම අංශය පහත සදහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

| | |
|---|---|
| අතිරේක ලේකම් | 01 |
| පරිපාලන නිලධාරි | 01 |
| භාෂා පරිවර්තක | 03 |
| කළමනාකරණ සහකාර | 12 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 |

## 5.6 මූල්‍ය අංශය

මෙම අංශය කොමිෂන් සභා කාර්යාලය සඳහා නිර්බාධ මූල්‍ය තොරතුරු ප්‍රවාහයක් සහ කළමනාකරණ පද්ධතියක් සහතික වෙමින් මූල්‍යමය සේවා සපයයි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් සපුරාලනු ලැබේ.

- කොමිෂන් සභා කාර්යාලය සඳහා මූල්‍ය සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ හා සේවා සැපයීම

- ස්ථාවර වත්කම් කළමනාකරණය
- මූල්‍යමය කරුණු සම්බන්ධව මාර්ගෝපදේශනය සහ උපදේශනය
- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වන ලේකම්වරයාට මූල්‍ය අංශයේ කටයුතු පිළිබඳව යාවත්කාලීන තොරතුරු සැපයීම
- අංශ අතර මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය
- ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම

මෙම අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

| | |
|---|---|
| ගණකාධිකාරී | 01 |
| කළමනාකරණ සහකාර | 05 |

## 6. මුදල් ප්‍රතිපාදනය

2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ වියදම් සාරාංශය පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| පුනරාවර්තන | **125439000.00** | **123257730.63** | **2181269.37** |
| ප්‍රාග්ධන | **119280000.00** | **106911416.99** | **12368583.01** |
| එකතුව | **244719000.00** | **230169147.62** | **14549852.38** |

වගුව අංක 07

## 07. කාර්ය මණ්ඩලය

### 7.1 සංවිධාන සටහන

සංවිධාන සටහන සඳහා ඇමුණුම 03 බලන්න.

### 7.2 කාර්ය මණ්ඩල සංයුතිය

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 195 කින් සමන්විත වූ අතර එම කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන්

සභා කාර්යාලය සත්‍ය වශයෙන්ම සේවයේ යොදවන ලද කාර්ය මණ්ඩලය 153 ක් විය. එහි කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**කාර්ය මණ්ඩල විස්තර**

| | |
|---|---|
| ලේකම් | 01 |
| අතිරේක ලේකම් | 02 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 04 |
| සහකාර ලේකම් | 24 |
| ගණකාධිකාරී | 01 |
| පරිපාලන නිලධාරී | 02 |
| භාෂා පරිවර්තක | 03 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 77 |
| රියදුරු | 12 |
| කාර්යාල සේවක | 25 |
| **එකතුව** | **153** |

## 7.3 කාර්ය මණ්ඩල පුහුණු කටයුතු

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ විෂය දැනුම, භාෂා ප්‍රවීනතාවය, තාක්ෂණික දැනුම හා විශේෂ කලමනාකරණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමේ අවස්ථාව 2014 වර්ෂය තුළද ආයතනය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

| ශ්‍රේණිය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 12 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 30 |
| ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් | 02 |

වගුව අංක 08

## 08. 2014 වර්ෂය තුළ එක් එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන

| **අංශය** | **ශ්‍රේෂ්ඨාධිකරණය** | **අභියාචනාධිකරණය** | **පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය** |
|---|---|---|---|
| ආයතන | 38 | 02 | 15 |
| පත්වීම් | 72 | 09 | 185 |
| විනය | 32 | 21 | 126 |
| අභියාචනා | 49 | 7 | 375 |
| **එකතුව** | **191** | **39** | **701** |

වගුව අංක 09

## 09. කොමිෂන් සභා රැස්වීම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කොමිෂන් සභා රැස්වීම් 120 ක් පවත්වා ඇත.

## 10. ස්තුතිය

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද බොහෝ සුවිශේෂ කටයුතු වලදී සියලුම අමාත්‍යංශ ලේකම්වරුන්ද, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ද, විශේෂයෙන් ,

- ජනාධිපති ලේකම් කාර්යාලය
- අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
- තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය
- නීතිපති දෙපාර්තමේන්තුව හා
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය ද

දක්වනු ලැබූ අනුබලය හා දායකත්වය වෙනුවෙන් කොමිෂන් සභාවේ කෘතවේදීත්වය මෙහිලා විශේෂයෙන් සනිටුහන් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| ජනාධිපති නීතිඥ විනිසුරු සත්‍යා හෙට්ටිගේ මහතා | සභාපති | .................... |
| එස්.සී.මාන්නප්පෙරුම මහතා | සාමාජික | .................... |
| ආනන්ද සෙනෙවිරත්න මහතා | සාමාජික | .................... |
| එන්.එච්.පතිරණ මහතා | සාමාජික | .................... |
| එස්. තිල්ලෛයිනඩරාජා මහතා | සාමාජික | .................... |
| ඒ.මොහොමඩ් නහියා මහතා | සාමාජික | .................... |
| කාන්ති විජේතුංග මහත්මිය | සාමාජික | .................... |
| සුනිල් එස්. සිරිසේන මහතා | සාමාජික | .................... |
| වෛද්‍ය අයි.එම්. ද සොයිසා ගුණසේකර මහතා | සාමාජික | .................... |

ඇමුණුම 01

**සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා**

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි**

| 2014.01.01 දිනට නිම නොවී තිබූ පැමිණිලි සංඛ්‍යාව | 2014 වසර තුළ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 2014.12.31 දිනට ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළ පැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ පැමිණිලි සංඛ්‍යාව | 2014.12.31 දිනට නිම නොවූ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **188** | **123** | **311** | **20** | **02** | **289** |

**ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2014.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2014 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2014.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2014.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **73** | **35** | **108** | **22** | **4** | **82** |

**අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2014.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2014 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2014.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2014.12.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **25** | **5** | **30** | **3** | **-** | 27 |

- ඉහත අභියාචනා වලට අමතරව 2014.01.01 – 2014.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත පැමිණිලි ඉදිරිපත් කර නොතිබුණි.

- 2014.01.01 – 2014.12.31 කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 24 ක් වන අතර එම පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා යවා ඇත.

- 2014.01.01 – 2014.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 35 ක් සඳහා කටයුතු කර ඇත.

ඇමුණුම 02

**සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නොවන නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා**

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි**

| 2014.01.01 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2014 වසර තුළ ලැබුණු සංඛ්‍යාව | 2014.12.31 දිනට ලැබී තිබූ මුළු සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළ සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ සංඛ්‍යාව | 2014.12.31 දිනට නිම නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **240** | **150** | **390** | **77** | **05** | **308** |

**ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2014.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2014 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2014.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2014.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **56** | **34** | **90** | **05** | **0** | **85** |

**අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2014.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2014 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2014.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 201412.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **7** | **01** | **08** | **-** | **-** | **08** |


- 2014.01.01 – 2014.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත නඩු 03 ක් සඳහා කරුණු ඉදිරිපත් කර ඇත.

- සමාලෝචිත කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි 02 ඉදිරිපත් කර ඇත.

- 2014.01.01 – 2014.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත පැමිණිලි 45 ක් ඉදිරිපත් කර ඇත.

**ඇමුණුම 03**

## සංවිධාන සටහන
## රාජ්‍ය සේවා කොමිෂන් සභාව




<u>සටහන :</u>

අති. ලේකම් – අතිරේක ලේකම්
ස.ලේ. – සහකාර ලේකම්
ජ්‍යෙ.ස.ලේ. – ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
තො.සං.තා. – තොරතුරු හා සංනිවේදන තාක්ෂණ

**රූපසටහන අංක 05**